**බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
-----------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 27 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වියදම් ගිණුම් 06 කට අදාළ එකතුව රු.1,321,259 ක් වූ ආපසු ලැබීම් එම ගිණුම් වලට බැර නොකර, සමුච්චිත අරමුදලට බැර කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු රු.203,400 ක් හා භාණ්ඩාගාර බිල්පත් මත පොලී රු.42,651 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු.404,180 ක ස්ථාවර වත්කම් සහ පුස්තකාල පොත් මිලදී ගැනීමේදී ලැබී තිබුණු රු.70,946 ක වට්ටම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දී පරිත්‍යාගයක් ලෙස ලැබී තිබුණු ජල බවුසරයේ වටිනාකම සහ රු.97,875 ක සේවක ඇප ආයෝජන සහ ඊට අදාළ රු.2,263 ක පොලී ගිණුම් ගතකර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ණයහිමි ශේෂ 06 ක එකතුව රු.347,143 ක් වැඩියෙන් ද, තවත් ණයහිමි ශේෂ 04 ක එකතුව රු.71,365 ක් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දී ඉටු කරන ලද කර්මාන්ත 06 ක් සඳහා ගෙවිය යුතු එකතුව රු.1,630,964 ක් වූ ප්‍රාග්ධන ආධාර සහ කසල කළමනාකරණය වෙනුවෙන් ගෙවිය යුතු රු.500,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

---------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.52,164,158 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.3,849,047 ක අසමානතා විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම්**

-------------------

රු.761,993 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන අදාළ ගැලපීම් කර ගිණුම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) ඉදිරියට ගෙනෙමින් පවතින රු.511,577 ක උසාවි දඩ, රු.51,325,338 ක් වූ මුද්දර ගාස්තු සහ එකතුව රු.858,816 ක් වූ වීථි පහන් ආධාර හිඟ මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

(ii) ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.22,966 ක් වූ ලැබිය යුතු ගිණුම් 04 ක ශේෂ, රු.470,962 ක් වූ අත්තිකාරම් ගිණුමේ ශේෂය සහ සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.44,504,800 ක් වූ ණයගැති ශේෂ පැවැතියද, ඒවා නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.22,250,626 ක් වූ රජයේ ආධාර ගිණුමේ ශේෂය සහ රු.4,257,062 ක් වූ වෙනත් ණයහිමි ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

එකතුව රු.52,008,359 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු සහ අයිතිය තහවුරු කෙරෙන ලියවිලි ද, එකතුව රු.63,310,649 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද වත්කම් පන්ති අනුව පිළියෙල කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය සහ උපලේඛන ද, එකතුව රු.137,275,766 ක් වූ ණයගැති සහ ණයහිමි ශේෂ සම්බන්ධයෙන් ණයගැති හා ණයහිමි ලේඛන, කාල විශ්ලේෂණ සහ ශේෂ සනාථ කිරීම් සහ රු.3,048,654 ක් වූ ස්ථාවර තැන්පතු සහතික 09 කට අදාළ තැන්පතු සහතික යනාදී සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.29,119,840 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.9,437,038 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.19,682,802 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් බඳවාගෙන තිබුණු සේවකයින්ගේ වැටුප් හා දීමනා ගෙවීම සඳහා සභාවේ ආදායමින් රු.11,890,057 ක මුදලක් වැයකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ ස්වයං උත්පාදන ආදායම් ප්‍රමාණය ඉක්මවා පුනරාවර්තන වියදම් වල වැඩිවීමක් පැවතීමෙන් සභාවට ලැබෙන ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින් පුනරාවර්තන වියදම් ප්‍රමාණය ආවරණය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) ආදායම් ඉහල නංවා ගැනීමට සභාවේ අවධානය යොමු නොවුවහොත් මූල්‍ය තත්ත්වයේ අහිතකර බලපෑම් මත සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ගැටළු සහගත තත්ත්වයක් උද්ගත වියහැකි බව විගණනයේ අදහසයි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ප්‍රාග්ධන ආදායම ඉක්මවා රු.21,881,828 ක ප්‍රාග්ධන වියදම් දරා තිබුණි. සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව අපේක්ෂිත ප්‍රාග්ධන ආදායම ඉක්මවා රු.24,550,000 ක් ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු කර තිබුණු නමුත්, ඊට අරමුදල් සපයා ගන්නා ආකාරය පිළිබඳ පැහැදිලි කර නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

වරිපනම් බදු, බදු කුලී සහ වෙළඳ බලපත්‍ර වෙනුවෙන් සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති එකතුව රු.27,778,661 ක් වූ හිඟ ආදායම් වලින් රු.7,088,308 ක් අය වී තිබුණි. ඒ අනුව හිඟ ආදායම් අය කිරීමේ ප්‍රගතිය සියයට 26 ක් පමණ විය.

**2.3.2 වරිපනම් බදු**

**--------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වර්ෂය ආරම්භයට වූ රු.25,423,626 ක් වූ හිඟ මුදල වර්ෂය අවසාන වනවිට තවත් රු.2,564,322 කින් ඉහළ ගොස් තිබුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) ඡේදය පරිදි හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සංවර්ධනය වූ දේපල පිළිබඳ සමීක්ෂණයන් සිදුකර වරිපනම් ප්‍රදේශය පුළුල් කර ආදායම් ඉහළ නංවා ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් අනුව කටයුතු කර නොතිබුණි.

**2.3.3 බදු කුලී**

**--------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගතයුතුව තිබූ රු.2,148,227 ක් වූ බදුකුලී අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි.

(ආ) කඩ කාමර 59 කින් රු.306,434 ක බදු මුදලක් හා රු.51,059 ක දඩ මුදලක් අයවිය යුතුව තිබුණි.

**2.3.4 බලපත්‍ර ගාස්තු**

----------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ වෙනුවෙන් අයවිය යුතුව තිබූ රු.128,748 ක් වූ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.51,325,338 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.511,577 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**----------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ සිට ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.20,339 ක් වූ අගරු චෙක්පත් නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට ක් වූ 29අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) සභාවේ සේවය කර ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගිය සහ මිය ගිය නිලධාරීන් 38 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 805,348 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවරගෙන නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,153,371 ක මුදලක් බැංකුගත නොකර අත ඉතිරි ලෙස සභාව තුළ රඳවා ගෙන තිබුණි. ප්‍රධාන හා උප කාර්යාලවලට දෛනිකව ලැබෙන මුදල් පිළිබඳව මුදල් රෙගුලාසි 177(1) ප්‍රකාරව සහ දෛනික මුදල් බැංකුගත කිරීම පිළිබඳව මුදල් රෙගුලාසි 177(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,200,000 ක් වූ මුදලක් කඩිනමින් මුදල් කරගත හැකි ආකාරයට "සත්දින ඇමතුම් තැන්පතු" යටතේ ආයෝජනය කිරීම නිසා සභාවට උපයාගත හැකිව තිබූ ඉහළ ආයෝජන පොලී ආදායම් අහිමි වී තිබුණි.

**3.3 සන අපද්‍රව්‍ය කළමනාකරණය**

--------------------------------

2013 සැප්තැම්බර් 09 දිනැති කමිටු තීරණය පරිදි බලප්‍රදේශය තුළ දෛනිකව එකතු වන කසල වර්ග කිරීමකින් තොරව රජගම ප්‍රාදේශීය සභාවේ මොන්රෝවියාවත්ත කසල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය වෙත භාරදීම වෙනුවෙන් මාසිකව රු.100,000 බැගින් ගෙවිය යුතුව තිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

---------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයක රු.500,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයද, තවත් වියදම් විෂයයන් 06 ක වූ එකතුව රු.21,843,603 ක ඉතිරිවීම්ද, වියදම් විෂයයන් 03 ක අනුමත සීමාවන් ඉක්මවා එකතුව රු.72,619,991 ක් වූ වියදම්ද, ආදායම් විෂයයන් 06 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම් රු.18,662,907 ක් පැවැතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

------------------------

පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. කෙසේ වුවද, සභාව විසින් පත්කර තිබුණු අභ්‍යන්තර විගණන නිලධාරියාට සමාලෝචිත වර්ෂයේ දී වැටුප් හා දීමනා ලෙස රු.568,144 ක මුදලක් ගෙවා තිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

---

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**4.4 වත්කම් කළමනාකරණය**

---

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) නිෂ්ක්‍රීය වත්කම්**

---

සභා භූමියේ දිරාපත් වෙමින් පවතින වාහන තුනක් 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධානවලට අනුව අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කර නැවත ප්‍රයෝජනයට ගැනීමට 2016 අප්‍රේල් 29 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

**(ආ) පවරා නොගත් වත්කම්**

---

සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන 05 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට 2016 අප්‍රේල් 29 දින වනවිටත් කටයුතු කර නොතිබුණි

**5. පද්ධති හා පාලන**

---

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) වාහන පාලනය
(ඊ) මානව සම්පත් කළමනාකරණය